බ්‍රිතාන්‍ය ජාතික මාධ්‍යවේදියෙකු සහ ඔහුගේ ස්වදේශීය මඟපෙන්වන්නා ඇමසන් ආශ්‍රිත ප්‍රදේශයකදී අතුරුදන්වීම පිළිබඳව සැකපිට අයෙකු අත්අඩංගුවට ගත් පුවත, ජාත්‍යන්තර මාධ්‍ය තුළ මෙන්ම, දේශීය මාධ්‍ය තුළද අවධානයට යොමු වී තිබිණි. ඒ මේ අයුරිනි.

ජාත්‍යන්තර මාධ්‍ය

The Guardian: සැක පිට අත්අඩංගුවට ගත් අය සතුව මත්ද්‍රව්‍ය සහ හමුදා භාවිතයට සීමා කර ඇති ෂොට්ගන් වර්ගයේ අවියක් හා පතොරම් තිබූ බව වාර්තා කරයි.

CNN: "මත්ද්‍රව්‍ය බොහෝ ප්‍රමාණයක්" සහ නීතිවිරෝධී දඩයම් සඳහා භාවිතා වන පතොරම් සන්තකයේ ඇති බව සොයා ගැනීමෙන් පසු පුද්ගලයෙකු මේ සම්බන්ධයෙන් සැකපිට අත්අඩංගුවට ගත් බව වාර්තා කරයි.

දේශීය මාධ්‍ය

දිනමිණ: "බ්‍රිතාන්‍ය මාධ්‍යවේදියාගේ අතුරුදන් වීමට සැක පිට මත්ලෝලියෙකු අත්අඩංගුවේ" (සිරස්තලය)

ඒ අනුව,

1) දිනමිණ සිරස්තලයෙන් හෝ අන්තර්ගතයෙන්, මෙම පුවතේ සැබෑ තොරතුරු හෙළිදරව් වන්නේ යැයි ඔබ සිතන්නේ ද?

2) මෙම පුවත ජාත්‍යන්තර මාධ්‍ය ඔස්සේ වාර්තා වී ඇති ආකාරය බලන විට, මත්ද්‍රව්‍ය හා තහනම් පතොරම් සන්තකයේ තිබී සැකපිට අත්අඩංගුවට ගත් අයෙකු "මත්ලෝලියෙකු" ලෙසින් දක්වන දිනමිණ සිරස්තලය, ඔබට අනුව කෙතරම් නිරවද්‍ය ද?

එසේම මෙම දිනමිණ සිරස්තලයේ සඳහන් "මත්ලෝලියා" යන යෙදුම පමණක් සන්දර්භයෙන් පිටට ගෙන බැලූ විට, මත්ද්‍රව්‍ය ඇබ්බැහියක් සිදුවන්නේ සංකීර්ණ කරුණු සමුදායක් හේතු කොට ගෙන විය හැකි බැවින්, එය හුදු මත්ද්‍රව්‍ය සඳහා ලොල් වීමකට ලඝු කළ නොහේ. ඒ අනුව, "මත්ලෝලියා" වැනි යෙදුම් ඔස්සේ මත්ද්‍රව්‍ය භාවිතා කිරීම පිළිබඳ වැරදි අදහසක් සමාජගත විය හැක. 'මතට ඇබ්බැහි වූවන්', 'මත්ද්‍රව්‍ය භාවිතා කරන්නන්' වැනි යෙදුම් ඒ වෙනුවට වඩාත් යෝග්‍ය විය හැක.

වඩාත් පරිපූර්ණ වාර්තාකරණයක් වෙනුවෙන්, නිසි ලෙස තොරතුරු වාර්තා කරමු.

The Guardian පුවත:
https://www.theguardian.com/.../dom-phillips-authorities...

CNN පුවත:
https://edition.cnn.com/.../dom-phillips-bruno.../index.html